# රැකියා ඇබෑර්තු

ප්‍රමුඛ පෙළේ නිෂ්පාදන හා බෙදාහැරීම් ආයතනයක් වන ඩිස්ටිලරීස් කොම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී ආයතනයේ යාන්ත්‍රික වෑද්දුම්කරු තනතුරෙහි පුරප්පාඩුව සඳහා පහත සඳහන් වගකීම් ඉටු කිරීමට හැකි සුදුසුකම් සහ පළපුරුදු සහිත අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## යාන්ත්‍රික වෑද්දුම්කරු (Mechanical Fitter) - සීදුව

### ප්‍රධාන වගකීම්

- නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ වන යන්ත්‍රසූත්‍ර හා උපකරණ වල නිසි ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාම සඳහා නියමිත කටයුතු සිදුකිරීම.
- කල්තියා දෝෂ හඳුනා ගැනීම, හඳුනාගත් දෝෂ නිරාකරණය කිරීම, ඒවා සටහන් කිරීම මෙන්ම නඩත්තු කටයුතු සඳහා වැය වන කාලය අවම කිරීම.
- අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය වන අමතර කොටස් හා අමුද්‍රව්‍ය තොග ප්‍රමාණවත් ලෙස පවත්වා ගැනීම.
- යන්ත්‍රසූත්‍ර පිරිසිදු කිරීමේ කටයුතු සිදුකිරීම මෙන්ම ඉතා පිළිවෙල වැඩ පරිසරයක් පවත්වා ගැනීම.
- භාවිතා කරන උපකරණ, මෙවලම්, ආයුධ හා ආම්පන්නයන් නිසි අයුරින් පරිහරණය කිරීම.

### අවශ්‍ය සුදුසුකම්

- සිලෝන්-ජර්මන් තාක්ෂණ විද්‍යාලය හෝ අනිකුත් අදාළ ආයතනයක් විසින් පවත්වනු ලබන Millwright Fitter පාඨමාලාව සාර්ථකව අවසන් කර තිබීම.
- කර්මාන්තශාලාවක හෝ බෝතල්කිරීම් කටයුතු සිදුකරන ස්ථානයක යාන්ත්‍රික වෑද්දුම්කරුවෙකු ලෙස පළපුරුද්දක් තිබීම.
- සියළුම යන්ත්‍රෝපකරණ වලට අදාළ ද්‍රව්‍ය මිනුම් ලබාගැනීම, ඉංජිනේරු ඇඳීම් (Technical Drawings & Schematics), කැපීම්, ඇඹරීම් සවි කිරීම්, හිඩැස් පිරවීම් හා ඔප දැමීම් ආදී පිරිසැකසුම් කටයුතු සම්බන්ධයෙන් මනා ප්‍රායෝගික දැනුමකින් යුක්ත වීම.
- පෑස්සුම්කරණය හා යන්ත්‍රකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
- විශිෂ්ට ගැටළු විසඳීමේ හැකියාව සහ නඩත්තු අවශ්‍යතා කල්තියා හඳුනාගැනීමට ඇති හැකියාව.
- රැකියා ස්ථානයේ ආරක්ෂාව වෙනුවෙන් කැපවීම හා කණ්ඩායම් හැඟීමෙන් යුතුව වැඩ කිරීමට ඇති හැකියාව.

ඔබගේ අයදුම්පත මෙම දැන්වීම පළවී දින 10ක් ඇතුළත පහත ලිපිනයට හෝ විද්‍යුත් තැපෑල වෙත යොමු කරන්න.

අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරෙහි අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. විද්‍යුත් තැපැල් මගින් අයදුම්පත යොමු කිරීමේදී අයදුම් කරන තනතුර ඊමේල් පණිවිඩයේ විෂය ලෙස සඳහන් කරන්න.

THE ORIGINAL DCSL ESTD 1913

DISTILLERIES COMPANY OF SRI LANKA PLC

ප්‍රධාන මානව සම්පත් නිළධාරී
ඩිස්ටිලරීස් කොම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී
අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10.
විද්‍යුත් ලිපිනය :- careers.dcsl@melsta.com